# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1869/8 – 2014 ජූලි 01 වැනි අඟහරුවාදා – 2014.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බම්බලපිටිය (කොට්ඨාස අංක 47, බම්බලපිටිය - කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2011/887 හා 2012.12.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0192 ක් පමණ වන පහත සඳහන් නම්වලින්, ප්‍රමාණවලින්, මායිම්වලින් යුත් ඉඩම් කොටස්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0130**
උතුරට: කො. 8049 වැනි මූලික පිඹුරේ කැබලි අංක 27; නැගෙනහිරට: රම්‍ය පාරේ වරි. අංක සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; දකුණට: රම්‍ය පාර; බටහිරට: දුම්රිය මාර්ග රක්ෂිතය.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0062**
උතුරට: රම්‍ය පාර; නැගෙනහිරට: කො. 8049 වැනි මූලික පිඹුරේ කැබලි අංක 28; දකුණට: කො. 8049 වැනි මූලික පිඹුරේ කැබලි අංක 29; බටහිරට: දුම්රිය මාර්ග රක්ෂිතය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2004/එච්ඩබ්ලිව්/03.
අත්කර ගැනීමේ නිලධාරියාගේ
යොමු අංකය: සී/ඒඩීඑස්/අත්/ආර්ඩීඒ/එස්පී/04/08/28-1.
2014 ජූනි මස 19 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 446


1A – G19802 – 05 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*